# දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණු විශ්ව විද්‍යාලය

## විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ මාලාව - 2016

## ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය - ඉතිහාසය (ඉ.ප්‍ර 1.2)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය : කංචන ජනප්‍රිය

**(01)** ලෝකයේ බිහිවූ ප්‍රධාන ගංගා නිම්න ශිෂ්ටාචාරය

- → මෙසපොතේමියාව ( යුප්‍රටීස් -ටයිග්‍රීස් ගංගා)
- → මිසරය (නයිල් ගංගාව )
- → චීනය ( හොවැංහෝ ගංගාව )
- → මොහෙන්දජාරෝ ,හරප්පා ( සින්දු ගංගාව )

**(02)** ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සොයාගැනීම

සින්දු ගංගාව ආශ්‍රිතව ව්‍යාප්තව ඇති මෙම ශිෂ්ටාචාරයේ සලකුණු මුලින්ම හමුවී ඇත්තේ ක්‍රි.ව. 1856 වසරේදීය. මීට අයත් පුරාවිද්‍යාත්මක ස්ථාන දැනට පකිස්ථානය සහ ඉන්දියාව සතුව පවතී. මෙම ශිෂ්ටාචාරය පිළිබඳව විධිමත් ගවේෂණ සිදු කිරීම ආරම්භ කොට ඇත්තේ ක්‍රි.ව. 1921 වසරේදීය.

ව්‍යාප්ත වූ ප්‍රදේශය

ස්ටුවට් පිගොට් ,මොතිමර් විලර්, ආර්.සී. මජුම්දාර් වැනියන් මෙම ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය පිළිබඳ ඉදිරිපත් කර ඇති මවාද වඩා වැදගත්ය.

ශිෂ්ටාචාරය පැවති කාල වකවානුව

ක්‍රි.ව. 2500-1500 දක්වා වූ අවු: 1000 ක කාලයක් මෙම ශිෂ්ටාචාරය පවතින්නට ඇති බව වර්තමාන පිළිගැනීමයි.

**(03)** ලෝකයේ දියුණු නාගරික ශිෂ්ටාචාරයක් බවට ඇති සාධක

- දියුණු නාගරික ශිෂ්ටාචාර ලක්ෂණ තිබීම.
- උසස් සංස්කෘතියකට හිමිකම් කීම.
- නගර නිර්මාණය ඇතුළු නුවර ,පිට නුවර , බලකොටු , ධාන්‍යාගාර , නාන තටාක ඇතුලත් නාගරික ලක්ෂණ පැවතීම.
- දියුණු කැලි කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය ,සනීපාරක්ෂක ක්‍රම දක්නට ලැබීම.
- දියුණු සන්නිවේදන ක්‍රම භාවිතය.
- කලාව (චිත්‍ර ,මූර්ති, කැටයම් ,මැටි බඳුන් )
- සැලසුම් සහගත නිවාස, තට්ටු නිවාස, ප්‍රසිද්ධ ගොඩනැගිලි දක්නට ලැබීම.
- දියුණු ජල ප්‍රවාහන පද්ධතිය , කානු පද්ධතිය ,ළිං ,ජලනල තටාක දක්නට ලැබීම.
- සැලසුම් සහගත මංමාවත් පද්ධතිය

- දියුණු ක්‍රමික කිරුම් මිණුම් ක්‍රම භාවිතය
- ජ්‍යාමිතික සම්බන්ධතා

මොහෙන්දජාරෝ හා හරප්පා යන නගර දෙකම එක සමාන ස්වරූපයෙන් නිර්මාණය කර ඇති අතර නගර දෙකේම බටහිර පැත්තට වන්නට පාලන කටයුතු සඳහා වෙන් වූ පවුරු පදනම් වලින් ආරක්ෂිත ඇතුළු පුරයක් හමු වී තිබේ. එම ඇතුළු පුරය යාර 400×200 ප්‍රමාණයෙන් යුක්ත වන අතර අඩි 30-50 දක්වා උස්වූ පදනමක් මත රජයේ විශේෂ ගොඩනැගිලි ඉදිකර තිබේ. ඊට හේතුව වන්නට ඇත්තේ රජයේ විශේෂ ගොඩනැගිලි ජලගැලීම් වලින් ආරක්ෂා කිරීමයි. මෙය දේශපාලන කටයුතු සඳහා වෙන් වූ අතර සැම ගොඩනැගිල්ලක්ම පුළුස්සනු ලැබූ ගඩොලින් නිමවා තිබේ. තවද අඩි 85 ක් පමණ ඉදිරිපසින් යුත් අඩි 95 ක් පමණ පළල් අඩි 4, 5 ක් පමණ සහ පිට බිත්ති සහිත නිවාස බෙහොමයක් හමු වී තිබේ.

ඉන්දු නිම්නයේ ප්‍රධාන මාර්ග අඩි 9 සිට අඩි 34 දක්වා පළලකින් යුක්ත වන අතර සමහර ස්ථානවල සැතපුම් දෙකක් පමණ සෘජුව පිහිටා තිබේ. මෙම ප්‍රධාන මාර්ග හැරුණු විට සැලැස්මකින් තොරව ඒ මේ අත විසිරී ඇති පටු මංමාවත් රැසක්ද ඉන්දු නිම්නයෙන් හමුවී තිබේ. ඉන්දු නිම්නයේ නාගරික ලක්ෂණ අතර මෙම ප්‍රධාන මාර්ගයට සමාන්තරව ගලා යන පරිදි සකස් කර තිබෙන කානු පද්ධතිය වැදගත් වේ. එම කානු පද්ධතිය හොඳින් පුළුස්සනු ලැබූ ගඩොලින් හා පිප්සම් භාවිතා කර නිර්මාණය කර තිබෙන අතර, විශාල ගඩොල් පුවරුවලින් ආවරණය කර තිබේ. ඉන්දු නිම්නයේ සැම නිවසකටම ළිඳක් , නාන කාමරයක් සහ ජල බේසමක් තිබූ අතර එම නිවාස වලින් පිටවන අපවිත්‍ර ජලය භූ ගත කාණු මගින් ප්‍රධාන මාර්ගයට සමාන්තරව ගලා යන කානු පද්ධතියට සම්බන්ධ කර තිබේ. මෙම කානු පද්ධතියෙහි නූතන කානු පද්ධතිවල මෙන් සමාන දුරකින් යුක්තව පිරික්සුම් කවුළු යොදා තිබේ. එම පිරික්සුම් කවුළු සහිත ස්ථානයන්හි කාණු ඉතා ගැඹුරින් සාදා ඇති අතර ඊට හේතු වන්නේ ජලයේ කිසියම් ඝන අපද්‍රව්‍යයක් ගලා ආ විට එම ස්ථානයේ රඳවාගෙන බාධාවකින් තොරව ජලය ගලා යාමට ඉඩ සැලසීමයි. මෙම කානු පද්ධතිය රෝම ශිෂ්ටාචාරය වන තෙක් ලොව වෙනත් කිසිදු ශිෂ්ටාචාරයක දක්නට නොමැති වැදගත් නාගරික ලක්ෂණයකි.

ඉන්දු නිම්නයේ නාගරික ලක්ෂණ අතර ආලෝක ස්තම්භ හෙවත් ආලෝක කුළුණු ද වැදගත් වේ. එමෙන්ම ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ගෘහ නිර්මාණ ක්‍රමයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ප්‍රධාන මාර්ගයට පිටුපා පටු මංමාවත්වලට මුහුණ ලා ප්‍රධාන දොර කවුළු තබා තිබීමයි. ඊට හේතුව වූයේ ඉන්දු නිම්න ශිෂ්ටාචාරවාසීන් සනීපාරක්ෂාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබීමයි. එනම් දූහුවිල්ල වැනි අපද්‍රව්‍ය නිවාසවලට ඇතුළුවීම වැලැක්වීම සඳහා එසේ ගොඩනැගිලි ඉදිකරන ලද බව පැහැදිලිය. එමෙන්ම ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙහි සැම නිවසකටම පාහේ මැද මිදුලක් හෙවත් විවෘත අංගනයක් දක්නට ලැබේ. ඒ තුළින්ද බලාපොරොත්තු වී ඇත්තේ සනීපාරක්ෂාව නැතහොත් වාතාශ්‍රය ලබා ගැනීමයි.

නගරයක් සඳහා මනා නඩත්තුවක් පැවතීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව ප්‍රධාන නගර නඩත්තු කරන ලද කම්කරුවන් සඳහාද වෙන් වූ නිවාස පෙළක් වෙනමම ඉන්දු නිම්නයේ දක්නට

ලැබේ. ගොඩනැගිලි නිර්මාණයේදී එතරම් සැලකිලිමත් වූ ඉන්දු නිම්නවාසීන් මොහෙන්දජාරාවේ නිර්මාණය කරන ලද කම්කරු නිවාසයක් අඩි 20X12 ප්‍රමාණයෙන් යුක්තය. මෙම කම්කරු නිවාස එක පෙළට නිර්මාණක කර තිබෙන අතර එක නිවාසයක් කාමර දෙකකින් යුක්ත වේ.හරප්පාවෙන් කම්කරු නිවාස හමුවන්නේ එහි තිබූ ප්‍රධාන ධාන්‍යාගාරය අසලනි. ඒවා සේවකයන්ගේ යයි අනුමාන කෙරේ. නූතන ඉන්දියාවේ කම්කරු නිවාස සමඟ සැසඳීම්දී මේවා තත්වයෙන් උසස් බව බොහෝ ඉතිහාසඥයෝ පිළිගනිති.

ඉන්දු නිම්නයේ නටබුන් අතර මොහෙන්දජොරාවෙන් හමු වී ඇති මහා ස්නානාගාරයද වැදගත් වේ. එය විශාල ගොඩනැගිලි සංකීර්ණයක් මැද පිහිටා තිබෙන අඩි 180X108 ප්‍රමාණයෙන් යුක්තව වූ විශාල භූමි භාගයක ව්‍යාප්තව පවතී. හොඳින් පුළුස්සනු ලැබූ ගඩොල් භාවිතා කොට ඇති පොකුණේ ප්‍රමාණය අඩි 39X23 ප්‍රමාණයෙන් යුක්තය. එහි ගැඹුර අඩි 9 ක් පමණ වන අතර දෙපසින් පොකුණට බැසීම සඳහා පියගැට පේළි 2 ක් දක්නට ලැබේ. එමෙන්ම ඒ අසලින් විශාල ළිඳක නටබුන් දක්නට ලැබේ. ඉහල සිට ක්‍රියාත්මක කළ හැකි 6X6 ප්‍රමාණයෙන් කැරකෙන බෝක්කුව මගින් වරින්වර ජලය පවිත්‍ර කර තිබේ.

ඉන්දු නිම්නයේ ප්‍රධාන ධාන්‍යාගාරය 45X15 ප්‍රමාණයෙන් යුක්ත වන අතර එහි ඇති රැස්වීම් ශාලාව $24m^2$ ප්‍රමාණයෙන් යුක්ත වේ. එම රැස්වීම් ශාලාව කුළුණු පේළි 4 කින් යුක්ත වන අතර මොහෙන්දජාරාවෙන් අඩි 230X78 ප්‍රමාණයේ විශාල වූ මන්දිරයක නටබුන් හමුවන අතර මෙය පාලකයෙකුගේ ප්‍රධාන මන්දිරය බවට සැක පහළ වී ඇත. නැතහොත් පූජකයින්ගේ වාස භවනය වන බවට තවත් මතයකි. නාගරික ශිෂ්ටාචාරයක් වූ ඉන්දු නිම්නයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණය වන්නේ නූතන නගරවල මෙන් නොව අලංකාරත්වයට වඩා සනීපාරක්ෂාවට විශේෂ අවධානයක් යොමු කර තිබීමයි.

**(04) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සමාජ තත්ත්වය**

- එහි විසූ මානව වර්ග
- මාතෘ මූලික සමාජයක් වීම
- පංති භේදය පැවතීම
- අහාර පාන
- නිවාස ,ඇඳුම් පැළඳුම්
- විනෝදාංශ හා ක්‍රීඩා
- සිරිත් විරිත් ,පුද පූජා

**(05) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආර්ථික තත්වය**

- කෘෂිකර්මාන්තය
- දේශීය හා විදේශීය වෙළඳාම
- හීලෑ සතුන් ඇති කිරීම
- කර්මාන්ත

## (06) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආගමික තත්වය

- මව් දෙවඟන පිදීම (ජගත් මාතා වන්දනය )
- පුරුෂ දේව වන්දනය
- ලිංග වන්දනය
- සත්ව රූප වන්දනය
- යෝනි වන්දනය
- වෘක්ෂ වන්දනය
- ජලය වන්දනය
- අං පිදීම
- මළවුන් පිදීම
- ත්‍රි මූර්ති පිදීම

## (07) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සමකාලීන ශිෂ්ටාචාර සමඟ පැවැත්වූ සම්බන්ධතා

සමකාලීන ශිෂ්ටාචාරවල දක්නට ලැබෙන පොදු සාමාන්‍ය ලක්ෂණ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙහි ද දක්නට ලැබේ. උදාහරණයක් ලෙස නගර නිර්මාණය ,තඹ හා ශිලා මෙවලම් භාවිතය කුඹල් සක, රූපාක්ෂර , රෝද සහිත වාහන ආදිය මෙහිදී වැදගත් වේ.

හරප්පාවේ මුද්‍රා මෙසපොතේමියාවෙන්ද මෙසපොතේමියාවේ මුද්‍රා ඉන්දු නිම්නයෙන්ද ලැබේ.එමගින් පැහැදිලි වන්නේ සමකාලීන ශිෂ්ටාචාර සමඟ ඉන්දු නිම්නය පැවැත්වූ සම්බන්ධතාවයයි. සමාජ චාරිත්‍රවල බලපෑම හා ආගමික බලපෑම ද මීට උදාහරණයක් ලෙස දැක්විය හැක. උඩුරැවුල බෑම, හිසකෙස් බැඳීම මව් දෙවඟන පිදීම, සමකාලීන බොහෝ ශිෂ්ටාචාරවල දක්නට ලැබුණි. මැටි බඳුන්වල චිත්‍ර හා මෝස්තර මිසරය හා සමඟ පැවති වෙළඳ සම්බන්ධතා පිළිබඳවත් තොරතුරු පුරාවිද්‍යාත්මක සාධක මගින් තහවුරු වේ. එබැවින් මිසරය,මෙසපොතේමියාව, හොවැංහෝ ශිෂ්ටාචාරය සමඟ ඉන්දු නිම්නය පැවැත්වූ සම්බන්ධතා තහවුරු වේ.

## (08) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීම

- දේශගුණික විපර්යාස
- වසංගත රෝග පැතිරීම
- ජල ගැලීම
- සතුරු ආක්‍රමණ

# ගුප්ත යුගයේ සංස්කෘතික ප්‍රබෝධය

ජ්‍යෙ.කථී. කාංචන ජනප්‍රිය

ගුප්ත යුගයේ ඉන්දියන් ඉතිහාසයේ සංස්කෘතික වශයෙන් ප්‍රබෝධයක් ඇතිවූ අවධියක් ලෙස සැලකේ. දේශපාලනික වශයෙන් ගුප්ත යුගයේදී ඇතිවන ඒකාබද්ධතාවය ආර්ථික සමෘද්ධියට හේතුවේ. එය සංස්කෘතික උද්දීපනයක මාවත හෙළි කලේය. පළමුවන චන්ද්‍රගුප්ත විසින් ගොඩනැගූ කුඩා ගුප්ත රාජ්‍යසමුද්‍රගුප්ත විසින් අධිරාජ්‍යයක් බවට පත්කළ අතර පස්වන චන්ද්‍රගුප්ත කුමාරගුප්ත ස්කන්ධ ගුප්ත වැනි පාලකයන් යටතේ තවදුරටත් පෝෂණය විය. ගුප්ත රජවරුන් ඉන්දියන් ඉතිහාසයේ හින්දු අධිරාජ්‍යයක නිර්මාතෘ ලෙස සළකනු ලබයි.

හින්දු ආගම ඉන්දියාවට බිහි කිරීමේ ගෞරවය ගුප්තයන්ට උරුම වේ. එතෙක් ඉන්දියාවේ තිබූ වෛදික අදහස් සංවර්ධනය කරමින් නව ආගමක් ඉන්දියාවට හඳුන්වාදීමට ගුප්තයන් සමත් විය.' අනුව ත්‍රිමූර්තියක් මුල් කරගෙන ආරම්භයේදී හින්දු ආගම බිහිවිය. ත්‍රිමූර්තිය යනු බ්‍රාහ්මණ, විෂ්ණු සහ ශිව වන්දනයයි. එහෙත් බ්‍රාහ්මණ ඇදහීම එතරම් ජනප්‍රිය නොවූ අතර ගුප්ත යුගයේදී වඩාත් ජනප්‍රිය වන්දනයක් බවට පත්වූයේ විෂ්ණු සහ ශිව වන්දනයයි. ඒ නිසාම පසුකලෙක හින්දු ආගමේ ප්‍රධාන දෙවිවරුන් දෙපලක් බවට විෂ්ණු සහ ශිව වන්දනය එක් විය.

ගුප්ත පාලකයන් විසින් හඳුන්වාදෙන ලද නව හින්දු ආගම ජනප්‍රිය කොට ඊට පිරිස් සම්බන්ධ කරගැනීම උදෙසා ඔවුන්ට විවිධ උපායන් මාර්ග ඇත. එතෙක් ඉන්දියාව තුළ බුද්ධිවාදී ආගම් ලෙස සළකනු බුදුදහම සහ ජෛන ආගමට තිබූ සමාජ තත්වය තම නව ආගමට ලබාගැනීම ගුප්තවරුන්ගේ අරමුණ විය. එම්අරමුණ පෙරදැරි කරගෙන විෂ්ණුවට, දස අවතාර සංකල්පයක් රෝපණය කලේය. විෂ්ණු අවස්ථා දහයකදී අවතාර දහයක් පෙනී සිටි බවත් ඉන් නවතම අවතාරය බුදුන් වහන්සේ බවත් ඔවුන් පෙන්වා දුනි. වරාහ වාමන නරසිංහ වාසුදේව ක්‍රිෂ්ණා ආදි ලෙස අවතාර දහයක් විෂ්ණුට තිබූ බවත් ඉන් නවවන අවතාරය බුදුන් වහන්සේගේ බවත් ගුප්තයන්ගේ අදහස විය. මෙමගින් උත්සාහ ගෙන ඇත්තේ ගුප්ත යුගයේදී බුදුදහමට තිබූ පිළිගැනීම උපයෝගි කරගෙන බුදුන් වහන්සේද තමන්ගේ දෙවියෙක් ලෙස පෙන්වමින් නව ආගමට පිරිස් එක්කර ගැනීමයි. මින් පැහැදිලි වන්නේ එතෙක් ඉන්දියන් සමාජය තුළ ප්‍රමුඛත්වය ලද බුද්ධිවාදය අභිබවා භක්තිවාදය ඉදිරියට ඒමයි. බුදුදහම හා ජෛව ආගම වැනි දර්ශනයන් මගින් හෙළි වන්නේ ඥානමාර්ගය සහ බුද්ධි වාදයයි. නමුත් ගුප්තයන් බිහිකළ හින්දු ආගම තුලින් බුද්ධිවාදය යටපත් කොට භක්තිවාදය මතු කිරීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ.

මෙම වකවානුවේදී අශ්වමේධ, රාජසූය. ව්‍යාජ්ෂය, වැනි යාගයන් පැවැත්වීම සිදුවිය. මින් පැහැදිලි වන්නේ ගුප්ත යුගයේදී එතෙක් ඉන්දියාව තුළ තිබූ වෛදික යාග හෝම වලට පුනර්ජීවයක් ඇති බවයි. ගුප්ත යුගයේදී විෂ්ණුට දස අවතාරයක් රෝපණය කලා මෙන්ම ශිව වන්දනයද ජනප්‍රිය විය. එය ශක්තිය පිළිබඳ සංකල්පයකින් යුත් වන්දනයක් විය. ශිව සහ පාර්වතී එක්වීම පිළිබඳව විශ්වාස කොට ලිංග පූජා පැවැත්වීම සිදුවිය. ස්ත්‍රී පුරුෂ එක් වීම තුලින් ඇතිවන ශක්තිය විමුක්ති මාර්ගයක් බව ශිව වන්දනයේදී පැහැදිලි විය.

එබැවින් ගුප්ත යුගයේදී බුදු දහමට සහ ජෛන.ආගමට පෙර තිබූ වැදගත්කම අඩුවිය. භක්තිය සහ ශක්තිය මුල් කරගත් හින්දු ආගමේ පුනරුදය ඊට හේතුවයි.

ගුප්ත රජවරුන්ගේ අනුග්‍රහය මත ඉන්දියාවේ අධ්‍යාපනයේදී සිග්‍ර සංවර්ධනයක් ඇති විය. මෙකල අධ්‍යාපනය ලැබීමේ අයිතිය ක්ෂත්‍රිය සහ වෛශ්‍ය දරුවන්ට හිමි වූ අතර ශුද්‍රයන් අධ්‍යාපනය ලැබීමේ කිසිදු අයිතියක් නොතිබුණි. අධ්‍යාපනය ලබාදුන්නේ බ්‍රාහ්මණයන් විසිනි. පුළුල් විෂය මාලාවක් යටතේ ව්‍යාකරණ නිවැරදිව ඉගැන්වීමටමෙම වකවානුවේදි හුරු විය.නාලන්දා, ජගද්ලා, වික්‍රමශිලා වලශිවැනි අධ්‍යාපනික ආයතන මෙකල ප්‍රබල උසස් අධ්‍යාපනිකආයතන ලෙස සංවර්ධනය විය. අයෝධ්‍යාවටද හින්දු අධ්‍යාපනික මධ්‍යස්ථානයක්ලෙස ප්‍රසිද්ධ විය. බරණැස මුල් කරගෙන බ්‍රාහ්මණ අධ්‍යාපනයේදී පුනර්ජීවයක් ගුප්ත යුගයේදී ඇතිවිය. ඇතැම් ඉතිහාසඥයන් නාලන්දා ජගද්දලා සහ වික්‍රමශිලා ගුප්ත අධ්‍යාපන මධ්‍යස්ථාන බවත් ගුප්ත රජවරුන් ඒවාට අනුග්‍රහ දැක්වූ බවත් අභිලේඛන මූලාශ්‍ර මගින් තහවුරු වේ.

ගුප්ත යුගයේදී සංස්කෘත භාෂාවද පිබිදීමකට ලක්විය. ඔවුන්ගේ සෙල්ලිපි ලියැවී ඇත්තේ මනහර සංස්කෘත කවි බසිනි. හරිසේන ලියූ අලහබාද් ප්‍රශස්තියද වත්ස්‍ය නම් කවියා ලියූ මන්දසෝර ප්‍රසස්තියද මෙම වකවානුයේ රසික මනහර සංස්කෘතික අභිලේඛන අතර විය.

ගුප්ත යුගයේ සාහිත්‍ය ක්ෂේත්‍රයද දීප්තිමත් අවධියක් විය. මෙම අවධියේදී කාලිදාස නම් භාරතීය නාට්‍ය රචකයා ජීවත් විය. සකුන්තලා මේඝදූතය රාග්‍රවංශය කුමාර සම්භවය ඍතු සංහාරය වැනි විශ්ව කිර්තියට පත් ග්‍රන්ථ රචනා කලේ ගුප්ත යුගයේදීය. එකී ග්‍රන්ත කාලිදාස විසින් රචනා කරන ලද අද්විතිය ග්‍රන්ත ලෙෂ සැලකේ. රාමායනය,. මහා භාරතය වැනි වීරකාව්‍යන් ඉන්දියාවේ රචනා වන්නේ ගුප්ත යුගයේදීය. මුද්‍රා රක්ෂය කෘතිය රචනා කළ විශාඛදත්ත මැටි කරත්තය නම් කෘතිය රචනා කළ ශුද්‍රකද ගුප්ත යුගය නියෝජනය කලේය.

දෙවන චන්ද්‍රගුප්ත රජුගේ රාජ සභාවේ කවීන් 09 දෙනෙකු සිටි බව සඳහන් වේ. ඔවුන්ට නවරත්න කවීන් යැයි කියනු ලැබේ. දක්ෂ නාට්‍ය රචකයෙකු වූ භාෂා මුනිවරයා ගුප්ත යුගයේ ජීවත්විය. මෙකල තාරකා විද්‍යාව පක්ෂා චිත්‍ර විද්‍යාව වැනි ක්ෂේත්‍රයන්ට අදාලව පොතපතද රචනා විය. ඒ අතරින් ප්‍රබල තාරකා විද්‍යාඥයෙකු වූ වරහමිහිර ගුප්ත යුගයේ ජිවත්විය. මෙම කරුණ මගින් පැහැදිලි වන්නේ සාහිත්‍යමය වශයෙන් දීප්තිමත් යුගයක් බිහිවූ උගතුන්ගේ පාරාදිසයක් බවට පත්වූ යුගයක් ලෙස ගුප්ත යුගය අගය කළ හැකි බවයි.

# ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳවැටීම

ජේ.ය.කට්. කාංචන ජනප්‍රිය

ඉන්දිය ඉතිහාසයේ ස්වර්ණමය යුගයක් වූ ගුප්ත යුගයේ පරිහානිය හා බිඳවැටීම පිළිබඳ අධ්‍යයනය කරන විට ඒ සඳහා බලපෑ ප්‍රධානතම සාධකය වූයේ හූන ආක්‍රමණයන්ය. ඊට අමතරව දුර්වල පාලකයන් බලයට පත්වීම. අභ්‍යන්තර බල් අරගල ප්‍රාදේශිය පාලකයන් ස්වාධීනවීමට ගත් උත්සාහය ආර්ථික පරිහානිය ආදි වූ තවත් කරුණු රාශියක් බලපෑ බව මුලාශ්‍ර වලින් අනාවරණය වේ.

- **හූන ආක්‍රමණ**

ක්‍රිව 415 - 455 ත් අතර කාලයේ ගුප්ත අධිරාජ්‍ය පාලන කල පළමු කුමාරගුප්ත රජු දවස ඉන්දියාවට හූණ ආක්‍රමණ එල්ල විය. තෝරමාන හා මිහිරකුල යන හූන නායකයන් යටතේ වයඹදිග ඉන්දියාවට බලවත් ආක්‍රමණ එල්ල විය. එම ආක්‍රමණවලින් ගුප්ත අධිරාජ්‍ය බේරාගැනීම සඳහා චන්ද්‍රගුප්ත කුමරයා යුධ පිටියට ගොස් සාමාන්‍ය සෙබලෙකු සේ යුධ පිටියේ නිදා ගනිමින් යුද්ධ කළ බවත් සඳහන් වේ. මෙලෙස මෙම බලවත් හූන ආක්‍රමණ වලින් ගුප්ත අධිරාජ්‍යය බේරා ගැනීම සඳහා ගත් බලවත් උත්සාහය ගුප්ත අධිරාජ්‍යයේ පරිහාණියට හා බිඳ වැටීමට බලපෑ බලවත්ම හේතුවක් විය.

- **විදේශ ආක්‍රමණ**

ගුප්ත අධිරාජ්‍යයට අයත් දකුණේ ප්‍රදේශ වලට විදේශ ආක්‍රමණ දිගින් දිගටම එල්ල වන්නට විය. පාලකයන් දුර්වල වන විට ශතුරු ආක්‍රමණ එල්ලවන ආකාරය ඕනෑම රජයකට විය හැකි පොදු කාරණයක් ලෙස පෙන්වා දිය හැකිය. පරිහානියට පත් වෙමින් පැවති ගුප්ත අධිරාජ්‍යයාගේ බිඳවැටීම මෙයද ප්‍රබල හේතුවක් විය.

- **ආර්ථිකය දුර්වල වීම**

දුර්වල කාලයක බලයට පත්වීම නිසා අධිරාජ්‍යයේ ආර්ථිකය පරිහාණියට ඇතැයි විශ්වාස කෙරේ. විශේෂයෙන්ම හූන ආක්‍රමණ වලදී ගුප්ත අධිරාජ්‍ය බේරා ගැනීමට ස්කන්ධ ගුප්ත රජු අතිශය රනශූරව ක්‍රියාකලේය. නමුත් හූණවරුන්ගේ ගුප්ත අධිරාජ්‍යය බේරා ගැනිමට යෑම නිසා ගුප්ත අධිරාජ්‍යයේ ආර්ථික සමෘද්දිය හීනවිය. ස්කන්ධ ගුප්ත පාලන සමයේ නිකුත්කළ කාසිවල රන් ප්‍රමාණය අඩුවීම. රිදී හා තඹ වැනි කාසි නිකුත්කර ඇති නිසා ඉන් එහි වර්ණය වන්නේ හූන ආක්‍රමණ වලින් ගුප්ත අධිරාජ්‍ය බේරා ගැනිමට ගත් උත්සාහය ගුප්ත අධිරාජ්‍යයේ ආර්ථිකය විශාල ලෙෂ පිරිහුණු බවයි. ආර්ථික පරිහානිද අධිරාජ්‍යයේ බිඳවැටීමට බලපෑ තවත් සාධකයක් විය.

- **ප්‍රාදේශිය පාලකයින් ස්වාධිනවීම**

හූණ අධිරාජ්‍යය පසුකාලීන පාලකයන් දුර්වල පාලකයන් වීම නිසා අධිරාජ්‍යයට අවනත භාවය ප්‍රකාශ කළ ප්‍රාදේශිය පාලකයන් අධිරාජ්‍යයෙන් නිදහස් වූ බව අනාවරණය වේ. මෙලෙෂ නිදහස වූ පාලකයෙකු ලෙස

මල්වානි යශෝවර්ණ නැමැති පාලකයාගේ අධිරාජ්‍යයෙන් නිදහස් වී අධිරාජ්‍යයට ලැබීමට තිබූ විශාල ආධායමක් අහිමිවීමටද බලපාන ලදී.

- <u>අභ්‍යන්තර බල අරගල</u>

ගුප්ත අධිරාජ්‍ය තුළම පසුකාලීන බල අරගල ඇතිවන්නට විය. ගුප්ත රාජවංශයේ රජවරු දෙපලකට බෙදී ඇති බව මින් අනාවරණය වන අතරමළු ක් පරම්පරාවක පුරගුප්ත, අනුගුප්ත, දෙවන කුමාරගුප්ත, පාලකයින්ද අනෙක් පරම්පරාවේ බුදුගුප්ත, බාහුගුප්ත, නරසිංහ ගුප්ත යන පාලකයන් අයත් විය. මේ ආකාරයට පෙලපත් අතර ඇතිවූ බල අරගලයද ගුප්ත අධිරාජ්‍යය බිඳ වැටීමට තවත් හේතුවක් විය.

- <u>දූර්වල පාලකයන් බලයට පත්වීම</u>

පළමු චන්ද්‍රගුප්ත සමුද්‍රගුප්ත, දෙවන චන්ද්‍රගුප්ත පළමුකුමාර ගුප්ත ස්කන්ධ ගුප්ත. වැනි පාලකයන් දක්ෂ හා රණශූර පාලකයන් වුවත් ගුප්ත අධිරාජ්‍යයේ අවසාන පාලන කාලයේ බලයට පත්වූ පූරගුප්ත. අනුගුප්ත, හානුගුප්ත, බුදගුප්ත වැනි පාලකයන් දූර්වල පාලකයන් බැවින් විදේශ ආක්‍රමණ හමුවේ මුහුණදීමට බිඳ වැටෙමින් පැවති ආර්ථිකය නගා සිටුවීමට අධිරාජ්‍ය තවදුරටත් පවත්වාගෙන යාමට මෙමං පාලකයින් නොහැකි විය. ඒ නිසා ගුප්ත අධිරාජ්‍යහ පරිහානියට පත්වෙමින් බිඳ වැටෙන්නට විය.